පාර්ලිමේන්තු ප්‍රශ්න මාලා අංක - 492
ආයතනයේ නම - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492
நிறுவனத்தின் பெயர் - தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம்.

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)-இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

**Parliamentary Series No. - 492**
**Name of the Institution - Department of National Botanic Gardens**

**Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)**

පාර්ලිමේන්තු ප්‍රශ්න මාලා අංක - 492

ආයතනයේ නම - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට සභාගත කරන ලද වාර්තාවේ සඳහන් නිරීක්ෂණ හා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම - 2023 මුදල් වර්ෂය

| | 2023 මූල්‍ය වර්ෂය සඳහා වන කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගෙන ඇති දුර්වලතා | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| පළමු කොටස | | |
| 1 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සැපයීම සඳහා මසකට වැඩි කාලයක් ලබා ගෙන නොමැති අතර දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් උද්භිද උද්‍යාන සහ ඒකක වලට අදාළව විගණන විමසුම් යොමු කර ඇති අවස්ථා වල අදාළ ඒකකයෙන් තොරතුරු (පිළිතුරු සනාථ කිරීමට අවශ්‍ය ඇමුණුම්ද සහිතව) කැඳවීමට කාලයක් ගතවන බැවින් එවැනි විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම තරමක් දුරට අසීරු වීම හේතුවෙන් පිළිතුරු ලබා දීමට මසකට වැඩි කාලයක් ගතව ඇත.<br><br>කෙසේ වුවද හැකි සෑම අවස්ථාවකදීම විගණනය වෙත කඩිනමින් පිළිතුරු යොමු කර ඇති බව කාරුණිකව ප්‍රකාශ කරන අතර, ඉදිරියේදී මසක් ඇතුළත පිළිතුරු සැපයීමට හැකි වන පරිදි පිළිතුරු ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස ඒකක ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇත. |
| 2 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා වීම. | අභ්‍යන්තර විගණන අංශ විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සැපයීම සඳහා මසකට වැඩි කාලයක් ලබා ගෙන නොමැති අතර දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙනත් උද්භිද උද්‍යාන සහ ඒකක වලට අදාළව විගණන විමසුම් යොමු කර ඇති අවස්ථා වල අදාළ ඒකකයෙන් තොරතුරු (පිළිතුරු සනාථ කිරීමට අවශ්‍ය ඇමුණුම්ද සහිතව) කැඳවීමට කාලයක් ගතවන බැවින් එවැනි විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම තරමක් දුරට අසීරු වීම හේතුවෙන් පිළිතුරු ලබා දීමට මසකට වැඩි කාලයක් ගතව ඇත. |

| | | |
|---|---|---|
| | | කෙසේ වුවද හැකි සෑම අවස්ථාවකදීම විගණනය වෙත කඩිනමින් පිළිතුරු යොමු කර ඇති බව කාරුණිකව ප්‍රකාශ කරන අතර, ඉදිරියේදී මසක් ඇතුළත පිළිතුරු සැපයීමට හැකි වන පරිදි පිළිතුරු ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස ඒකක ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇත. |
| 3 | 2017.06.28 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබීම. | 2023.10.09 දිනැතිව වත්කම් පිළිබඳව තොරතුරු වාර්තා කිරීම සඳහා නිලධාරියකු පත්කර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.<br>(ඇමුණුම 01) |
| 4 | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත වාර්තා කර නොතිබීම. | 2024.06.14 දිනැතිව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇති අතර ඒකක දෙකකින් පමණක් අපහරණ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් එම වාර්තා දෙක 2024.07.29 දිනැතිව යොමු කර ඇත.<br><br>මේ වන විට 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළතම මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය සිදු කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇත.<br>(ඇමුණුම 02, 03) |
| 5 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබීම. | අතිරික්ත, ඌනතා පිළිබඳව වාර්තා වී නැත. |
| 6 | මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබීම. | වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට නොඑළඹෙන ලෙස ඒකක ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. |

| | | |
|---|---|---|
| 7 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | 2023 .12.31 දිනට රු. 4,343,939.00ක ණය ශේෂයක් අය කර ගැනීමට පැවතියද එයින් 85%ක් 2026.04.30 දින වන විට අය කර ගෙන ඇත.<br><br>2026.04.30 දින වන විට තව දුරටත් අය කර ගත යුතු ණය ශේෂය වන්නේ රු. 622,573.34කි.එම අය කර ගැනීමට ඇති ණය ශේෂ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වන බව කාරුණිකව දන්වා සිටිමි.<br><br><u>මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ</u><br><br>එච්.පී.ආර්. හතුරුසිංහ මයා - ආපදා ණය -රු.34,365.00<br><br>විශ්‍රාම වැටුප් හිමිකම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් උරුමකරු ගෙවීම් යටතේ අවකරණ පියවීම සඳහා මධ්‍යගත අංශය වෙත ලිපිලේඛන ඉදිරිපත් කරන ලෙස දන්වා එවා ඇත.<br>නමුත් උරුමකරු පිළිබඳව නිශ්චිතව හඳුනාගැනීම සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇති බැවින් උරුමකරුවන් පිළිබඳව සනාථ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br><br>ඩබ්.අයි.එම්. වික්‍රමනායක මයා - ආපදා ණය - රු.152,648.34ක ශේෂයෙන් තව දුරටත් අය වීමට ඇත්තේ රු. 107,048.34 කි.<br>( 2024 මැයි මස සිට ඇපකරුවන්ගෙන් වාරික වශයෙන් අය කෙරේ.)<br>උත්සව - රු. 8750.00<br>විශේෂ - රු. 2800.00<br><br><u>සේවය හැරගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ</u><br><br>ජේ.එච්.එස්. හෙට්ටිආරච්චි මයා - ආපදා ණය - රු. 179,350.00<br><br>අමාත්‍යාංශ ලේකම් විසින් ඉල්ලා ඇති නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු තොරතුරු යවා ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම ණය මුදල ගෙවන ලෙස දන්වා 2026.04.08 දිනැතිව නිලධාරියා වෙත ලිපියක් නිකුත් කර ඇත.<br>(ඇමුණුම 04) |

| | | |
|---|---|---|
| | | <u>විශ්‍රාමගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ</u><br><br>කේ.ජී. ජයසිංහ මහතා - ආපදා ණය - රු. 84,460.00<br><br>සේවා පාරිතෝෂිකය සකස් කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.<br><br>එස්.පී. විජේරත්න මයා - ආපදා ණය - රු.205,800.00<br><br>විශ්‍රාම වැටුප් ගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. |
| 8 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම. | ටෙන්ඩර් තැන්පත් සඳහා වන පොදු තැන්පත් ගිණුමේ පවතින රු.15,000ක කල් ඉකුත් ශේෂය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කෞතුකාගාරය නවීකරණ ව්‍යාපෘතියට අදාළ මුදලක් වන අතර ඒ සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු නිරාකරණය වන තෙක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>කොන්ත්‍රාත් සඳහා වන රැඳවුම් මුදල් තැන්පත් කර ඇති පොදු තැන්පත් ගිණුමේ පවතින පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කෞතුකාගාරය නවීකරණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් බිල්පත් ගෙවීම් කිරීමේදී රඳවා ගත් මුදල් රු.4,938,003ක් සහ ජාතික ශාකාගාරයේ අණුක ජීව විද්‍යාගාරය ඉදි කිරීම කොන්ත්‍රාත්තුවට අදාළ රැඳවුම් මුදල් රු.542,850ක් තව දුරටත් , ඒ සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු නිරාකරණය වන තෙක් එම ගිණුමේ රඳවා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම සඳහා වන පොදු තැන්පත් ගිණුමේ පවතින Conservation actions for threatened endemic species ව්‍යාපෘතිය සඳහා සහ Development of conservation plan for two endemic and critically endangered (CR) tree species යන ව්‍යාපෘතින් සඳහා ලද අරමුදල් වලින් ඉතිරියයි. අදාළ ව්‍යාපෘතිය තව දුරටත් ක්‍රියාත්මක බැවින් ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කරන කාර්යයන් සඳහා නිරන්තර ගෙවීම් කිරීමට ඇති බැවින් තවදුරටත් රඳවා ගෙන තිබේ.<br><br>මීට අමතරව 2023 වර්ෂයට අදාළව කල් ඉකුත්ව තිබූ සියළුම තැන්පත් ශේෂයන් සඳහා මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| 9 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබීම. | කාර්යය නිම වී මසක් ඇතුළත ලබා ගත් තත්කාර්යය අතුරු අග්‍රිම නිරවුල් කරන ලෙස ඒකක ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. |
| 10 | ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. | Development of conservation plan for two endemic and CR tree species *Stemonoporus affinis* and *Stemonoporus gracilis*' යන ශීර්ෂය යටතේ ව්‍යාපෘති යෝජනා Botanical Garden Conservation International (BGCI) ආයතනයට ඉදිරිපත් කිරීමේ දී, එම යෝජනාව රාජනීය උද්භිද උද්‍යානයේ වැඩසටහන් සහකාර විසින් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් ඉදිරිපත් කරන ලදී. පසුව අප විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව BGCI ආයතනය මගින් පිළිගත් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ වසර තුන සඳහා (2021 සිට 2023 දක්වා) වසරින් වසර මෙම ව්‍යාපෘතියට ගිවිසුම් ගත වෙන ලදී. මෙම ගිවිසුම් අත්සන් කිරීමේ දී ශ්‍රී ලංකාවේ පාර්ශවය වෙනුවෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාමය යටතේ ගිවිසුම් ගත වූ අතර ව්‍යාපෘතියේ සියලුම වගකීම් ගිවිසුම් ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් විසින් දරණ ලදී.<br>ඒ අනුව විදෙස් ප්‍රදානයන් කරන ලද ආයතනය වන BGCI ආයතනය විසින් අදාල විදෙස් ප්‍රදාන ප්‍රේෂණය සඳහා ගිවිසුම් ගත වූ පාර්ශවය නමින් ඇති ගිණුමකට මුදල් බැර කිරීමට අදාළ විස්තර ඉල්ලා සිටි බැවින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් ඇති ලංකා බැංකුවට අයත් ජංගම ගිණුමේ විස්තර එම ආයතනයට ලබා දෙන ලදී. එම වසර තුනට අදාළ ලබා දෙන ලද මුදල් ඉහත ගිණුමට ප්‍රේෂණය කරල ලද අතර එම මුදල් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට බැර කර අදාළ වියදම් සිදු කරන ලදී.<br><br>නමුත් මේ වන විට විදෙස් ප්‍රදාන ප්‍රේෂණය පිළිබඳව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට අදාල උපදෙස් දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛ අංක DNBG /F/08/DEPOST/පොදු/ 2023 හා 2023/06/27 දිනැති ලිපිය මගින් අදාළ නිලධාරීන් දැනුවත් කර ලදී. ඒ අනුව විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මේ වන විට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.<br>( ඇමුණුම 05) |

| | | |
|---|---|---|
| 11 | විදේශ ප්‍රධාන ලෙස ලැබී තිබූ සියළු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොතිබීම. | වර්තමානයේදී විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කරනු ලැබේ. |
| දෙවන කොටස | | |
| 12 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබීම. | කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධන ගිවිසුම් සකස් කර ඇත. |
| 13. | සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතීම. | 2023 වර්ෂයේදී පුහුණු වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සීමා සහිත වීම නිසා සැලසුම් කරන ලද සියළු පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ අතර සේවා අවශ්‍යතා මත අත්‍යාවශ්‍යම පුහුණු වැඩසටහන් පමණක් පවත්වන ලදී. |
| 14 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. | තත්ත්වාගණනය කළ මතය ලබා දී ඇත. |
| 15 | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | පූර්ව ගිණුම්කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහතින් සඳහන් කර ඇත.<br><br>01. ගම්පහ උද්භිද උද්‍යානයේ අලංකරණ කටයුතු වැඩිදියුණු කිරීම.<br><br>මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ඒ යටතේ මල් වගාව සඳහා විශේෂිත වූ සැකිළි වර්ග සාදා ස්ථාපිත කර ඇත.<br><br>මෙම සැකිළි වල විවිධ වර්ණයේ මල් පිපෙන ශාක විශේෂ වාර්ෂික මල් පැල ලෙස වරින් වර වෙනස් කරමින් පවත්වා ගෙන යනු ලැබේ.<br><br>ඒ සඳහා තවාන් කොටසෙහි අමතරව වාර්ෂික මල් පැල හා බීජ පැල නොකඩවා නිෂ්පාදනය කිරීම හා නඩත්තු කිරීම සිදු කෙරේ.<br><br>මෙම සැකිළි වලට ජල සම්පාදනය ක්‍රමවත්ව සහ නොකඩවා සැපයීම සඳහා සකස් කර ඇති විසිරි ජල සම්පාදන පද්ධතිය නිසිආකාරව ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |

| | | |
|---|---|---|
| | | පැල නිෂ්පාදනය නොකඩවා පවත්වා ගෙන යාම සඳහා උද්‍යානයෙන්ම බීජ ලබා ගැනීමත් අනෙක් උද්‍යාන සමඟ හුවමාරු කරගෙන තවාන පවත්වා ගෙන යාමත් සිදු කෙරේ.<br>(ඇමුණුම 06, 07)<br><br>02. හක්ගල උද්භිද උද්‍යානයේ අනවසර පදිංචිකරුවන් සම්බන්ධව ක්‍රියා කිරීම<br><br>හක්ගල උද්භිද උද්‍යානයට අයත් බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල ඇති අනවසර පදිංචිකරුවන් විසින් අත්කර ගෙන ඇති ඉඩම් සම්බන්ධයෙන් නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2026.03.16 දිනැතිව ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ගේ ද සහභාගීත්වයෙන් රැස්වීමක් පැවැත්විණි. එහිදී අනවසර පදිංචිකරුවන් සිටින ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් හා රක්ෂිත ලෙස ගැසට් කර ඇති ඉඩම් හැර අනෙකුත් ඉඩම් උද්‍යානය තුළට ගැනෙන ලෙස මැනීම් කර මිනින්දෝරු සැලැස්මක් සකස් කර එම නව මැනීමට අදාළ ඉඩම් විධිමත්ව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට පැවරීමට තීරණය කරන ලදී.<br><br>ඒ අනුව නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කයට අදාළ මැනීම් කිරීම සඳහා මැනීම් ඉල්ලීම් අදාළ මිනින්දෝරු කාර්යාල වෙත යොමු කර ඇත. උද්‍යානයේ දළ සීමාව GPS මඟින් සලකුණු කර ඇති අතර උද්‍යානය තුළට ගත හැකි සෑම ඉඩමක්ම උද්‍යානය තුළට ගැනෙන ආකාරයට මැනීම් කිරීමට කටයුතු කරමින් ඇත.<br><br>03. හක්ගල උද්භිද උද්‍යානයේ ආපනශාලා බදු කුළිය සම්බන්ධව කටයුතු කිරීම.<br><br>හක්ගල උද්භිද උද්‍යානයේ ආපනශාලාව බදු දීම වෙනුවෙන් සේවක සුබසාධක සංගම් ගිණුමේ තැන්පත් කර තිබුණු 2007 අගෝස්තු සිට 2013 ජූලි දක්වා ලද බදු මුදල සඳහා වූ රු. 1,053,900.00ක් හා පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබූ රු. 270.650.00 ක මුදල් රජයේ ආදායමට බැර කර ඇත. |

| | | |
|---|---|---|
| 16 | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | අ.) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒකාබද්ධ සේවයට අයත් සියලුම නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි සේවා තොරතුරු යාවත්කාලීන කිරීම් යටතේ ඇතුළත් කර ඇත. තවද ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල වෙත වසර 05කට වඩා මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නිරත නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් ලැයිස්තුද ඉදිරිපත් කර ඇති අතර ඒකාබද්ධ සේවයේ ස්ථාන මාරු වීම් මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරව සිදු වේ.<br><br>ආ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරු සඳහා වාර්ෂික ස්ථානමාරු පටිපාටියක් සකස් කර ඇත. ඒ අනුව වර්තමාන සේවා ස්ථානයේ වසර 03 සම්පූර්ණ නිලධාරීන් 2026.06.01 දිනට ස්ථාන මාරු කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.<br><br>ඇ) උද්‍යාන සංවර්ධන සහකාර සහ ගාස්තු අයකිරීමේ සහකාර තනතුරු සඳහාද ස්ථානමාරු පටිපාටියක් සකස් කර ඇති අතර ඒ අනුව 2027.01.01 දිනට ස්ථානමාරු ක්‍රියාත්මක කිරීමට නියමිතය.<br><br>ඇ) ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් උද්‍යාන වලට කණිෂ්ඨ සේවකයින් බඳවා ගැනීමේදී අදාළ බඳවාගැනීම් සඳහා උද්භිද උද්‍යානයන්ට ආසන්න ප්‍රදේශ වල පදිංචියද සලකා බලනු ලැබේ.එසේ හෙයින් ඔවුන් ස්ථාන මාරු කිරීම සේවා අවශ්‍යතාවය මත හා ඔවුන් පදිංචි ස්ථාන වෙනස් කිරීම මත සිදු කරනු ලැබේ. නිල නිවාස ලබා දීමද අපහසු වේ. තවද සුළු වේතනයක් ලබා ගන්නා සේවකයන්, භූගෝලීය වශයෙන් එකිනෙක දුරස්ථව පිහිටා ඇති උද්‍යාන වලට වරින් වර ස්ථාන මාරු කිරීම වර්තමාන ආර්ථික රටාව මත මානුෂික නොවන බව පෙනී යන බවද කාරුණිකව දන්වා සිටිමි. |

.........................................
වෛද්‍ය දම්මික පටබැඳි,
පරිසර අමාත්‍ය.

ඇමුණුම් අංක (1)

(97)



# Government Non-Financial Asset Management System
# NFAMS

## User Registration Form

| | | | | |
|---|---|---|---|---|
| Name of the Institution | Department of National Botanic Gardens | | | |
| Institution Category (✓) | | Government Agency / Public Enterprises | | Provincial Council & Local Government |
| Employee Name (Mr/ Mrs/ Ms) | D.H.R.N.P.T. Rupasinghe. | | | |
| Designation | Deputy Director (Admin) | | | |
| Official Address | Department Of National Botanic Gardens, P.O. Box 14, Peradeniya. | | | |
| Tele No | | Mob. | | WhatsApp |
| NIC No. | | | | |
| E-mail | | | | |

*Please put a (✓) in front of the relevant fields*

| User Role | Data Entry | | Data Verification | |
|---|---|---|---|---|

**Assets to be assigned**

| | |
|---|---|
| Vehicles | ✓ |
| Lands | ✓ |
| Buildings | ✓ |
| Structures | |
| Plant & Machinery | |
| Furniture & Office Equipment | |

| | |
|---|---|
| Signature of the Employee | |

I certify that the aforementioned officer is employed for the above Institution and recommend that permission be granted for the tasks mentioned above to be performed in the online database (NFAMS).

| | |
|---|---|
| Name of the Head of the Institution (Mr/ Mrs/ Ms) | Y.M.Y. Yapabandara |
| Signature & Official Stamp of the Head of the Institution | [signature] Y.M.Y. YAPA BANDARA Director (Administration) Dept. of National Botanic Gardens Peradeniya<br>Date - 2023.10.09 |

සත්‍ය පිටපතක් බවට සහතික කරමි

[signature]

තුෂාරා යටිවාවල

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි (සිනුම්)

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# Government Non-Financial Asset Management System

# NFAMS

## User Registration Form

| | | | | |
|---|---|---|---|---|
| Name of the Institution | Department of National Botanic Gardens. | | | |
| Institution Category (✓) | | Government Agency | | Provincial Council & Local Government |
| | | Public Enterprises | | |
| Employee Name (Mr/ Mrs/ Ms) | P.A.M.K. Harshani Perera. | | | |
| Designation | Public Management Assistants' Service Officer.. | | | |
| Official Address | Department of National Botanic Gardens, P.O. Box 14, Peradeniya. | | | |
| Tele No | | Mob. 0716473369 | WhatsApp | |
| NIC No. | 199277702949. | | | |
| E-mail | p.a.m.k.h.perera@gmail.com. | | | |

*Please put a (✓) in front of the relevant fields*

| | | | | |
|---|---|---|---|---|
| **User Role** | Data Entry | | Data Verification | |

**Assets to be assigned**

| | |
|---|---|
| Vehicles | ✓ |
| Lands | ✓ |
| Buildings | ✓ |
| Structures | |
| Plant & Machinery | |
| Furniture & Office Equipment | |

| | |
|---|---|
| **Signature of the Employee** | [signature] |

I certify that the aforementioned officer is employed for the above Institution and recommend that permission be granted for the tasks mentioned above to be performed in the online database (NFAMS).

| | |
|---|---|
| **Name of the Head of the Institution** (Mr/ ~~Mrs~~/ ~~Ms~~) | Y.M.Y. Yapabandara |
| **Signature & Official Stamp of the Head of the Institution** | [signature] Y.M.Y. YAPA BANDARA Director (Administration) Dept. of National Botanic Gardens Peradeniya<br>Date - 2023.10.09 |

සත්‍ය පිටපත් බවට සහතික කරමි

[signature]

ඇමුණුම (02)


ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
Department of National Botanic Gardens
තැ.පෙ. 14, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.
த.பெ.14, பேராதனை, இலங்கை
P.O. Box 14, Peradeniya, Sri Lanka.

Department of National Botanic Gardens


මගේ අංකය / எனது இல / My No - DNBG/ACC/F17/ BO. SURVEY/2024

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date - 2024.06. 14

විගණන අධිකාරි,
විගණන අධිකාරි කාර්යාලය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පරන ගලහ පාර,
පේරාදෙණිය.

## 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පහත ඒකකවල 2023.12.31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අපහරණ වාර්තා මේ සමග ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

1. ප්‍රධාන කාර්යාලය, ජාතික උද්භිද උද්‍යාන ,පේරාදෙණිය
2. ජාතික ශාකාගාරය
3. මල් වගා හා පර්යේෂණ අංශය, පේරාදෙණිය
4. රාජකීය උද්භිද උද්‍යානය
5. අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානය
6. ගම්පහ උද්භිද උද්‍යානය
7. හක්ගල උද්භිද උද්‍යානය
8. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය
9. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය අවිස්සාවේල්ල
10. මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය
11. නාරාහේන්පිට උද්‍යාන සහයක කාර්යාලය
12. ජනාධිපති මැදුර උද්‍යානය, මහනුවර
13. නුවරඑළිය ජනාධිපති මැදුර උද්‍යානය
14. ජනාධිපති මැදුර උද්‍යානය, අනුරාධපුරය
15. අරලියගහමැදුර උද්‍යානය, කොළඹ.
16. අගමැති මැදුර උද්‍යානය, නුවරඑළිය
17. කොළඹ ජාවත්ත යුද සොහොන් ඒකකය
18. මහනුවර පිටකන්ද යුද සොහොන් ඒකකය

සත්‍ය පිටපතක් බවට සහතික කරමි

(අත්සන)

තුෂාරා යටිවාවල
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි (සිනුම්)
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

ප්‍රධාන ගණකාධිකාරි,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

පිටපත් -

01) ලේකම්/සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.

02) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්/රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව - කාරුණික දැ.ගැ.ස.


කාර්යාලය / அலுவலகம் / Office - 081-2388654
ෆැක්ස් / தொலை நகல் / Fax - 081-2388238
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General - 081-2388238
ඊ-මේල් / மின்னஞ்சல / E-mail - dirnbg@sltnet.lk

ඇමුණුම (03)

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம்
Department of National Botanic Gardens
තැ.පෙ. 14, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.
த.பெ.14, பேராதனை, இலங்கை
P.O. Box 14, Peradeniya, Sri Lanka.

Department of National Botanic Gardens

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DNBG/ACC/F17/BO.SURVEYS./2024 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.07. |

විගණන අධිකාරී,
විගණන අධිකාරී කාර්යාලය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පරන ගලහ පාර,
පේරාදෙණිය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2023 වර්ෂය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් එවා ඇති මගේ සමාංක හා 2024.06.14 දිනැති ලිපියට අමතර වශයෙනි.

02. ඒ අනුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පහත ඒකකවල 2023.12.31 දිනට සිදුකළ ප්‍රමාද වී ලැබුණු භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අපහරණ වාර්තා මේ සමග ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

01) වියළි කලාපීය උද්භිද උද්‍යානය - හම්බන්තොට
02) යුද සොහොන් ඒකකය - ත්‍රිකුණාමලය - නිලාවෙලි

සත්‍ය පිටපතක් බවට සහතික කරමි

..........................................
තුෂාරා යටවාවල
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී (ගිණුම්)
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

ප්‍රධාන ගණකාධිකාරී,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,පේරාදෙණිය.

පිටපත් -

01) ලේකම් / සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.

02) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් / රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව - කාරුණික දැ.ගැ.ස.

කාර්යාලය / அலுவலகம் 081-2388654 | ෆැක්ස් / தொலை நகல் 081-2388238 | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் 081-2388238 | ඊ-මේල් / மின்னஞ்சல dirnbg@sltnet.lk

ඇමුණුම (04)


මගේ අංකය
எனது இல.
My No.
C/295/2024 (CL)

ඔබේ අංකය
உமது இல.
Your No.
ENV/ADM/02/02/18/3/1

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone No.
2147888
2433967
2320800
2327919
2149001(2)

ඉලෙක්ට්‍රොනික් තැපැල
மின்னஞ்சல்
E-mail
administration@attorneygeneral.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax
2436421


# නීතිපති දෙපාර්තමේන්තුව
# சட்டமா அதிபர் திணைக்களம்
# ATTORNEY - GENERAL'S DEPARTMENT


තැ. පෙ. අංකය
அஞ்சல் பெட்டி
P. O. Box No. 502

කොළඹ 12.
கொழும்பு 12.
Colombo 12.


2026.04. 08

15 APR 2026
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

01.) ඒ.එච්.එස්. හෙට්ටිආරච්චි මහතා.
අංක 19.
මැදලන්දවත්ත.
කලල්පිටිය.
පස්යාල.

02.) ඒ.එච්.එස්.හෙට්ටිආරච්චි මහතා.
අංක: 64/02/02.
පොල්ගහගාරේ වත්ත.
ග්‍රීන්පාර්ක් පාර.
නිට්ටඹුව.

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරන ගරු නීතිපතිතුමාගෙන් ලද උපදෙස් පරිදි ඔබගෙන් ශ්‍රී ලංකා ජනරජය වෙත අයවිය යුතු රුපියල් එක් ලක්ෂ හැත්තෑ නව දහස් තුන්සිය පනහ (රු.179,350.00) ක මුදල ගෙවන ලෙස ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඔබ විසින් මෙම මුදල ගෙවිය යුතුව ඇත්තේ ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජනාධිපති මැදුර උද්‍යානයේ උද්‍යාන කම්කරුවෙකු වශයෙන් සේවය කරමින් සිටියදී 2021-08-04 දින සිට සේවය අතහැර ගොස් ඇති අතර ඔබ එම ජාතික උද්භික උද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී ශ්‍රී ලංකා ජනරජය සමග අත්සන් කරන ලද ආපදා ණය ගිවිසුම පරිදි ලබා ගන්නා ලද ආපදා ණය මුදල් නැවත ශ්‍රී ලංකා ජනරජයට නොගෙවීම මත ඔබ විසින් ගෙවිය යුතු එකී ආපදා ණය මුදල් වල ශේෂය වශයෙනි.

මෙම ලිපියේ සඳහන් දින සිට දින **30** ක් ඇතුලත ඔබ විසින් එම මුදල නොගෙවුවහොත් එකී රු.179,350.00/- ක මුදල හා ඒ මත නෛතික පොලිය ද නඩු ගාස්තු ද අයකර ගැනීමට වෙනත් කිසිදු දැන්වීමකින් තොරව ඔබට විරුද්ධව නඩු පවරනු ලබන බව වැඩිදුරටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ වෙනුවට.

පිටපත:- අධ්‍යක්ෂ (පාලන).
ජාතික උද්භිත උද්‍යාන දෙපාර්තමේන්තුව.
තැ.පෙ. 14.පේරාදෙණිය.
DNBG/1/12/ආපදා ණය.
CJ C 295/2024 (CL)

සත්‍ය පිටපතක් බවට සහතික කරමි

ගුෂාරා යටිවාවල
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි (ගිණුම්)
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

ඇමුණුම (05) ~~ඇමුණුම 01~~ (10)

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
தேசியதாவரவியல் பூங்காக்கள்திணைக்களம்
**Department of National Botanic Gardens**
තැ.පෙ. 14, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.
த.பெ.14,பேராதனை, இலங்கை
P.O. Box 14, Peradeniya, Sri Lanka.

Department of National Botanic Gardens

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனதுஇல<br>My No | DNBG/F/08/DEPOSIT/<br>පොදු /2023 | ඔබේ අංකය<br>உமதுஇல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.06.27 |

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ
සියළුම ඒකක ප්‍රධානීන් වෙත,

<u>ශ්‍රී ලංකාව වෙත වෙනත් රාජ්‍යයන්/ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්/ විදේශ ආයතන විසින් ලබා දෙනු ලබන විදේශ ප්‍රදානයන් (Grants) හා ශිල්පීය ආධාර (Technical Assistance) ලබා ගැනීම හා ඒවා නිසි පරිදි ගිණුම් ගත කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 1994.04.20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94, 2011.04.21 හා 2014.06.26 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක පිළිවෙලින් MOFP/ERD/2011/1 MOFP/ERD/2014/1 දරණ චක්‍රලේඛ, 2019.07.25, 2020.08.14 දින හා පිළිවෙලින් SC&PMU/Grant/19 හා SC&PMU/Grant/20 දරණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලිපි හා 2020.10.02 හා ERD/AE/GEN/16 අංක දරණ මුදල් අමාත්‍යාංශයේ ලිපිය හා 2023.03.24 හා 2023.03.27 හා පිලිවෙලින් අංක MF/ERD/2023/02 හා MF/ERD/2023/01 දරණ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛ හා බැඳේ.(පිටපත් අමුණා ඇත.)

02. ඒ අනුව විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර (විදේශ ශිෂ්‍යත්ව ආදිය ) නිවැරදි යාන්ත්‍රණය හා නිසි ක්‍රමවේදයෙන් බැහැරව විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා ආයතන විසින් ලබා ගැනීම හේතුවෙන් එම අරමුදල් සහ ඒවායේ දරණු ලබන වැය සහ ප්‍රතිලාභ නිසි පරිදි ශ්‍රී ලංකා ජනරජයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් නොවීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලෙස ජනරජ ගිණුමට අදාළව ඉදිරිපත් වූ විගණන නිරීක්ෂණ මඟින් අවධාරණය කර ඇති බව සඳහන් කර ඇත.

03. එබැවින් ඔබ හෝ ඔබගේ ඒකකයේ සියලුම නිළධාරීන් විසින් විවිධ ව්‍යාපෘති හා පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා රජය වෙත ලබාගන්නා සියලුම විදේශ ප්‍රදාන හා ශිල්පීය ආධාර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනු දැනුම හා එකඟතාවය මත ලබා ගත යුතු අතර, එසේ ලබා ගැනීමේදී ඊට අදාළව මුදල් රෙගුලාසි පරිච්ඡේද 11 හි ඡේද 610 සිට 626 දක්වා වූ උපදෙස් මෙන්ම ඉහත චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස්ද තරයේ පිළිපදින ලෙස කාරුණිකව දැනුම් දෙමි.

04. තවද, විදේශ ආධාර ප්‍රේෂණය සඳහා දෙපාර්තමේන්තුවේ නිළ ගිණුම් අංක විදේශ පාර්ශවකරුවන් වෙත මින් ඉදිරියට ලබා නොදිමට සියලුම ඒකක ප්‍රධානීන් කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

එච්.සී.ජී. ජයවීර
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙනිය
ඵ/ල

සත්‍ය පිටපතක් බවට සහතික කරමි
...........................
නුෂාරා යට්වාවල
ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි (ගිණුම්)
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

පිටපත: ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය - කැ.දැ.පි.

කාර්යාලය அலுவலகம் Office 081-2388654 | ෆැක්ස් தொலைநகல் Fax 081-2388238 | අධ්‍යක්ෂ ජනරාල් பணிப்பாளர் நாயகம் Director General 081-2388238 | විද්‍යුත් තැපැල් மின்னஞ்சல் E-mail dgpnbg@gmail.com

ඇමුණුම 06









ඇමුණුම (07)









